ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 118/ News/ 2011

ක්‍රි. ව. 2011 නොවැම්බර් 07 සඳුදා
04 වෙළුම - 03 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය



# සා. ලැටරන් බැසිලිකා දෙව් මැඳුර

ලමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

## ලැටරන් බැසිලිකාවේ පුරාවත

### ආදරණීය දුවේ පුතේ...

සාන්ත ජුවාම් ලැටරන් සසුන් පිය අග්‍ර බැසිලිකාව රෝමයේ ආසන දෙව්මැඳුරයි. එය රෝමයේ රදගුරු හිමිපාණන්ගේ එනම් ශුද්ධෝත්තම පියතුමාගේ නිල සසුන් ආසනය හිමි ආසන දෙව් මැදුරයි. ලැටරන් බැසිලිකාව යන කෙටි නමින් හැඳින්වුවද එහි නිල නාමය අති ශුද්ධවූ ගැලවුම්කරුවාණන්ගේ හා සාන්ත ස්නාවක ජුවාම්, සාන්ත සුවිශේෂක ජුවාම් තුමන්ගේ ලැටරන් අග්‍ර බැසිලිකාව යනුයි. සාන්ත ජුවාම් ලැටරන් අග්‍ර බැසිලිකාව ලෙසද එය හඳුන්වනු ලැබේ.

මේ බැසිලිකාව වඩාත් ඉපැරණි හා ශ්‍රේණිගත කිරීම් අනුව ප්‍රථම ස්ථානයේ ලා ගැනෙන සසුන් පිය බැසිලිකාවයි. සසුන් පිය බැසිලිකා හතරක් රෝමයේ ඇති අතර මෙය ඉන් ප්‍රමුඛතම බැසිලිකාවයි. එමෙන්ම එය සමස්ත කතෝලික ලෝකයේ මවු බැසිලිකාව ලෙසද කතෝලිකයන් අතර ව්‍යවහාරවේ. රෝමයේ රදගුරු හිමිපාණන්ගේ එනම් ශුද්ධෝත්තම පියතුමාගේ බැසිලිකාව ලෙස එතුමන්ගේ කිරුළ දැරීමේ දුර්ලභ හිමිකමද ලබා ඇත. සෙසු බැසිලිකා අතර වඩාත් ප්‍රසිද්ධ වතිකානයේ සාන්ත පීතර බැසිලිකාව වුවද අග්‍ර බැසිලිකා නාමයට උරුම හිමිකම් කියන්නේ ලැටරන් බැසිලිකාවය. වතිකානයට පිටතින් පිහිටි රෝම නගර සීමාවට එය අයත් වේ. එහෙත් එය අසාමාන්‍ය ලෙස වතිකානයට උරුම දේපළක් ලෙස රජයෙන් පවරා දී ඇත.

ලැටරන් මාලිගය පළමුවන කොන්ස්තන්තිනු අධිරාජ්‍යයා විසින් සසුන් පියාට පවරා දෙන ලදී. එකල සසුන් පිය නවාතැනද එය වූ අතර පසුකාලීනව එය වෙනස් විය. අතිඋත්තම තෙවැනි සර්ජියස් ශුද්ධෝත්තම පියතුමන් විසින් දසවන ශත වර්ෂයේදී ස්නාවක ජුවාම් තුමන්ට මෙය කැප කරන ලද අතර අතිඋතුම් දෙවන ලුෂියස් සසුන් පියාණන් විසින් දොලොස්වන සියවසේදී සුවිශේෂක ශාන්ත ජුවාම් මුනිඳුන්ට කැප කරන ලදී. මේ නිසා මේ සාන්තුවරුන් දෙනම ආසන දෙව් මැදුරේ සම අනුශාසක වරුන් වෙද්දී ගැලවුම්කාර ජේසුස් වහන්සේ එහි ප්‍රධාන අනුශාසක වෙති. වසර 1309 දක්වා පත්වූ සසුන් පියතුමන් බොහෝ දෙනෙක් සිය නවාතැන කර ගත්තේ ලැටරන් බැසිලිකාව අසල ඇති ලැටරන් මාලිගාවයි.

වර්ෂ 1307 දී හා 1361 දී දෙවරක් ලැටරන් බැසිලිකාව ගින්නට හසුවිය. එහෙත් කලින් කල එහි ප්‍රතිසංස්කරන කටයුතු සිදු කැරිණ. ලැටරන් බැසිලිකාව ඉදිරිපිට ඇති යෝධ කුරුසිය ලොව විශාලතම කුරුසිය ලෙස සැලකේ. ටොන් 455ක් බරැති මෙය අතිඋතුම් තෙවැනි තුට්මෝස් ශුද්ධෝත්තම පිය සමයේ ඉදි කිරීම අරඹා අතිඋතුම් සිව්වන තුට්මොස් සසුන් පිය සමයේ නිමා කැරිණ. ලැටරන් බැසිලිකාවේ ඇතුළත සිවිලිමේ අපූරු සිත්තම් රැසක් තිබේ. ඓතිහාසික ඉපැරණි බවින් පිරි මේ සිත්තම් මගින් පුරා විද්‍යාත්මක අගය මොනවට පැහැදිලි කරයි.

එහෙනම් දුවේ පුතේ ! ලැටරන් බැසිලිකාව ගැන දැන් ඔබ ගොඩාක් දේ දන්නවා නේද ? ඒ ඔස්සේ සැබෑ කතෝලික උරුමයේ මහිමය ලොවට ප්‍රකාශ කරන්නට ඔබ සමත් වන්නේ නම් එය සුවිසල් ජයග්‍රහණයකි.

ඔබ සැමට ජේසු පිහිටයි !

ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක
ශිරාන් මෛත්‍රී

## සාන්ත දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු සිරිලකට වැඩම කරයි.



තරුණ පරපුරේ පියා හා ගුරුවරයාවූ සාන්ත දොන් බොස්කෝ මුනිඳුන් යැයි භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු සසුන් පියා වරක් පැවසීය. එවන් විරුදාවලි ලත් සාන්ත දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු නොවැම්බර් 19 වැනිදා ඉන්දියාවේ සිට සිරිලකට වැඩම කෙරේ.

නොවැම්බර් 19 වැනි සෙනසුරාදා පෙරවරු 7 ට කටුනායක බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ගුවන් තොටුපළට සම්ප්‍රාප්ත වන සාන්ත දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු පිළිගැනීමෙන් පසු යැදුම් මෙහෙයක් පැවැත්වෙන අතර ඉන්පසු දුන්ගල්පිටිය ප්‍රාදේශියාධිපති නිවසට රැගෙන යයි. නොවැම්බර් 20 පල්ලියවත්ත, නොවැම්බර් 21 අහුන්ගල්ල, නොවැම්බර් 22 උස්වැටකෙයියාව, නොවැම්බර් 23 දංකොටුව, නොවැම්බර් 24 මැටියගනේ, නොවැම්බර් 28 - 29 මීගමුව යන ප්‍රදේශවල චාරිකා කැරේ. නොවැම්බර් 30 දා එතුමන්ගේ ශුද්ධවූ ධාතු කෙන්යාව බලා රැගෙන යයි.

# නිතරම කතා කරන "ප්‍රඥාව" යනු කුමක්ද ?



දම් මදුව

අලගොල්ලෑව සා. අන්තෝනි මහ විද්‍යාලයේ ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

ප්‍රඥාව යනු දැනුම සහ වටහා ගැනීම පදනම් කරගෙන නිවැරදි ලෙස විනිශ්චය කිරීම සහ වඩාත් හොඳ ක්‍රියා මාර්ගය ගැනීමයි.

ශුද්ධවූ පාවුලු තුමා 1 කොරින්ති 1/18-25 හි ප්‍රඥාව පිළිබඳව කදිම උපහැරණයක් ගෙන දක්වයි. එනම් කුරුසියේ පණිවුඩය ග්‍රීකයන්ට මෝඩකමක් ලෙස පෙනෙන නමුත්, එය දෙවියන් වහන්සේ ඉදිරියෙහි ප්‍රඥාව බව පාවුලු තුමා පෙන්වා දෙයි.

බයිබලීය ප්‍රඥාවේ මූලික ලක්ෂණයක් වන්නේ, දෙවියන් වහන්සේ ඉදිරියේ ජනයා යටහත් වී උන්වහන්සේගේ අණ පණත් රැකියා යුතු බවය.

බයබලීය ප්‍රඥා සාහිත්‍යය කදිම ලෙස දැක ගත හැකි පහත ග්‍රන්ථ තුනයෙහිය.

- ජෝබ්
- හිතෝපදේශය
- ධර්මදේශකයා

★ පැරණි ගිවිසුමේ ඉතාමත් ප්‍රඥාවන් පුද්ගලයා ලෙස සලකන්නේ සලමොන් රජුය.

★ ඉශ්‍රායෙලයේම ප්‍රඥා සාහිත්‍යය සම්බන්ධයෙන් කළ උත්සාහයේදී සලමොන්ගේ සේවය ඉතා අගනේය.

★ පැරණි ගිවිසුමේ ප්‍රඥාව ලෙස පුහුණු ශිල්පීන් වන වියන්නා, ගෘහ නිර්මාණ ශිල්පියා, රන් කරුවා වැන්වූන්ගේ දැනුම හඳුන්වා ඇත.

★ තවත් පැත්තකින් සොයා බැලුවිට ප්‍රඥාවෙන් අදහස් කළේ ජීවිතයේ ප්‍රශ්න සම්බන්ධයෙන් සූක්ෂම ලෙස බැලුවිට දක්වන ආකල්පයය.

★ මෙම ආකල්පය සලකා බලනවිට සලමොන් රජුගේ ප්‍රඥාව ඉතාම වැදගත් වන්නේය.

★ ධර්මදේශකයා නමැති පොතෙන් ප්‍රඥාව පිළිබඳ ලොකු අර්ථකථනයක් ලබා ගත හැකියි.

"දෙවියන් වහන්සේට ගරු බිය දක්වා, උන්වහන්සේගේ ආඥා පිළිපදින්න. මේ වනාහි සියලු මනුෂ්‍යයින්ගේ යුතුකමය.

මේ තුළින් අපට පෙනී යන්නේ, ප්‍රඥාව සහ නීතිය එකට සම්බන්ධ කර ඇති බවය.

**නීතිය රැකීමෙන් ප්‍රඥාව ඇති වන්නේය. ප්‍රඥාව ලැබනේනේ නීතියෙන්ය.**

## හලාවත සා. මරියා ප්‍රාථමික විදුහල් දිනය සමරති

හලා / සාන්ත මරියා ප්‍රාථමික බාලිකා විදුහලේ විදුහල් දිනය හා 117 වන සංවත්සරය සැමරීම හලාවත ආසන දෙව් මැදුරේ දී පැවැත්වුණි. හලාවත මීසම් සේවක ගරු රොන්කල්ලි ද සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය පැවැත්වුණි.

**ජෙරූෂා සිල්වා**
**5 ශ්‍රේණිය, සාන්ත මරියා ප්‍රාථමික බා.විදුහල - හලාවත**



පමුණුගම මහ විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානොත්සවය විදුහල් ජයන්ති රංගන ශාලාවේ දී විදුහල්පති අනුර ගුණවර්ධන මහතාගේ සංවිධානයෙන් පැවැත්වුණි.

උත්සවයට පැමිණි විදුහල් ආදි ශිෂ්‍යය තුඩැල්ල ක්‍රිස්තුරාජ විදුහලේ විදුහල්පති ගරු නිහාල් රුද්‍රිගු පියතුමන් ඇතුලු සම්භාවනිය අමුත්තන් විදුහලේ සිසුන් පිළිගෙන උත්සව ශාලාවට පැමිණෙන අයුරු ඡායාරූපයේ දැක්වේ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**



## ළමා ප්‍රදීපයට සේයාරූ එවීමේදී...

**ළමා ප්‍රදීපයට ඔබ එවන සේයාරූ (විශේෂයෙන් ජංගම දුරකතනයෙන්** (Camera - Phone ) **ඔබ ගනු ලබන සේයාරූ) නම්, පුවත් පතේ මුද්‍රණ තත්ත්වයට නුසුදුසු නම් පල නොකෙරෙන බැව් කරුණාවෙන් සලකන්න. මේ පිළිබඳව ඔබගේ අවධානය යොමු කොට "ළමා ප්‍රදීපය" සඳහා පළ කිරීමට සුදුසු තත්ත්වයේ සේයාරූ පමණක් අප වෙත යොමු කරන්න.**

**සංස්කාරක පියතුමා**

# අතිඋතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් විසින් ලියන ලද ලිපියක්

සුදු අක්කා වෙතටයි.
**Roma (102) 15 - 7 - 1927**
**Via Vittorino Da Feltre - 5**

කිතුනු උරුමය

උපුටා ගැනීම : ගරු අර්නස්ට් පෝරුතොට පියතුමන්ගේ "කාර්දිනල් කුරේ" ග්‍රන්ථයෙනි.

මා ප්‍රේම අක්කා,

නුඹ එවූ ආදරණීය ලියමනට සුළු වශයෙන් උත්තරයක් එවීමි. දිගට ලියන්ට වේලා නොතිබුනේය. එය සම්භවුනාදැයි නොදනිමි.

නුඹේ ලියුමෙන් ද අම්මා සහ පුංචක්කා එවූ ලියුම් වලින් ද නුඹේ අසනීපය දැන කණගාටු වූයෙමු. නමුත් දුක් නොවෙන්න. අහසෙහි පියාඹන කුඩා පක්ෂීන්ට පවාදිනපතා භෝජන සලස්වන්නාවූ අප පෙම්බර දෙවි පියාණෝ නුඹ සහ නුඹේ කුඩා දරුවන් මතක නැති නොකරති. ඔවුන් දේව භයෙහි සහ දේව ප්‍රේමයෙහි පමණක් වැඩි දියුණු කරන්නට උත්සාහ කරන්න.

රත්රන් ගින්නෙන් ශුද්ධ කරන්නාක් මෙන් සමස්තයින් දුක් කණගාටුවෙහි දෙවියන් වහන්සේ පිරිසිදු කරායයි. ශු. ලියවිල්ලේ ලියා තිබේ. තවද මවෙක් තම දරුවාට යම් දඬුවමක් දෙන්නේ එම දරුවා කෙරෙහි ඇති ප්‍රේමය උදෙසාත්, ඔහුගේ වැඩි දියුණුවට ඇති අභිලාෂය උදෙසාත් නොවේ ද? එමෙන්ම දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන දුක් කණගාටු උන්වහන්සේගේ ප්‍රේමයේ ලකුණකි. මෙය අපට සැනසිලිදායක කල්පනාවක් නොවේ ද? දෙමාපියෝ දරුවන්ට දඬුවම් නොකර හිතුවකට සැදෙන්ට ඇරීම ඔවුන්ට ප්‍රේම නොකිරීමේ නොහොත් ඔවුන් සාදන්ට බැරිය කියා කල්පනා කිරීමේ ලකුණක් නොවේ ද? අධර්මිෂ්ටයින්ගේ මෙලෝ වැඩි දියුණුව බොහෝ විට මෙසේ දෙවියන් වහන්සේ විසින් අත්හැර දැමීමේ ලකුණකි. එබැවින් අධෛර්යය නොවෙන්න. ශු. පවුල කෙරෙහි නුඹේ විශ්වාසය තබා, එම පවුල නඩත්තු කිරීමට දුක් වින්දා වූ ශු. ජුසේ තුමාගේ සහය අයදින්න. උන්වහන්සේ පවුලේ බර හොඳින් දන්නෙහිය. මේ ඇර මෝක්ෂ රාජ්‍යයෙහි සිටින නුඹේ කුඩා දේවදූතයින්ගේ පිහිට ඉල්ලන්නේ නැද්ද? ප්‍රසාද ස්නානයෙන් පසු මළාවූ මේ කුඩා දරුවෝ සැබවින් මෝක්ෂ රාජ්‍යයෙහි ය. තම මවගේ දුක්වලට ඔව්හු ඇහුම්කම් නොදී නොසිටිත්.

> මෙහි පළවන ලිපිය නව කාර්දිනල් තුමා රෝමයේ ඉගෙන ගන්නා කාලයේ දී එතුමා හැදූ නැන්දාට "සුදු අක්කාට" ලියන ලද එතුමාගේ අදහස් පිළිබිඹු කරන වටිනා ලිපියකි.

තවද මා ප්‍රේම අක්කා පොඩි හාමිනේ කීකරු බැගෑපත් ළමයෙක් කරන්ට වෑයම් කරන්න. අපේ දිළිඳුකම නින්දාවක් නොවූ බව ඈට හොඳින් කියාදෙන්න. මුළු ලොවට නායක වූ දෙවිතුමා දිළිඳු වඩුවෙක් මෙන් උපන්නා නොවේ ද? උන්වහන්සේට සමාන වීම අපට කොපමණ වාසනාවක් ද? සිතින් දිළින්දෝ භාග්‍යවන්තයෝ ය"යි උන්වහන්සේගේ ශ්‍රී මුවෙන් කියා තිබේ.

නුඹ පෙර එවූ ලියුමෙහි නුඹේ ඉවසීම දැක ඉතා සතුටු වුනෙමි. එනම් මගේ ලියුමේ තිබුනාකාර අවවාද සතුටින් පිළිගන්නෝ ස්වල්පයය. එයින් මා පෙර කිවූ මෙන්; ජේසු තුමා නුඹට ඉවසීම දී තිබෙන බව පෙනේ. උන්වහන්සේට ස්තුති කරමින් ඒ ඉවසීම වැඩි වැඩියෙන් දියුණු කරගන්ට උත්සාහ කරමු. නුඹේ කුඩා දරුවන්ට සහ නුඹටත් ජේසු තුමන්ගේ විශේෂ ආශිර්වාද ලැබේවා. ප්‍රේම මම්මා ද ඉතා ආදරයෙන් මතක් කරමි.

මීට,
නුඹේ කුඩා මල්ලී,
(ටී. බී. කුරේ, ඕ. ඇම්. අයි.)



කාර්දිනල් කුරේ හිමි අත්අකුරු



**පොඩි ෆාදර් ලියයි**

ගරු නිරංජන් විජේරත්න
(සා. බෙ. නි.) පියතුමා

# ජීවතුන් අතර මියැදුන දරුවන්



> අද සමාජයේ හුගක් දරුවන් විසින් මරණය ලගා කර ගන්නවා. ඉස්සරහින් අතදීලා පස්සෙන් අනිනවා වගේ වැඩක්. සිගරට්, අරක්කු, කුඩු පිස්සු පෙති මේවා නිසා තමන් විසින්ම මරණය ලගා කර ගන්නවා.
>
> ආදර දුවේ පුතේ අවාසනාවකට අපේ දරුවන් ජීවත් වුණත් ඉන්නේ මැරිලා වගේ. ඔහේ ජීවත් වෙනවා. ජීවිතයේ කිසිම අරමුණක් නැහැ.

ආදර දුවේ පුතේ නොවැම්බර් මාසය කිව්වාම අපට වැදගත් දවස් දෙකක් මතකයට එනවා. නොවැම්බර් පළමුවෙනිදා සියලු සාන්තුවරුන්ගේ මංගල්ලය සහ නොවැම්බර් දෙවෙනිදා මළවුන් සිහිපත් කරන දිනය. එමනිසා මං සිතුවා අද ඔබට ලියන ලිපියෙන් මේ දවස් දෙකේ ඇති වටිනාකම ගැන යමක් බෙදා ගන්නට.

සාන්තුවරයෙක් වෙනවා කියන්නේ ජේසු වගේ වෙනවා කියන එකයි. ජේසුස් වහන්සේ අපි හැමෝටම ආරාධනා කරනවා සිතින් දිළිඳු වන්නට, කරුණාවන්ත වන්නට, යුක්තිය ඉටු කරන්නට, නිර්මල සිත් ඇතිව ජීවත් වන්නට. මේ ගුණාංග අපි තුළ තියෙනවා නම් අපටත් ශුද්ධවන්ත වෙන්න පුළුවන්. මේ ගුණාංග ඔබ තුළ ඇති කර ගන්නට උත්සාහ ගන්න.

සාන්තුවරයෙක් කිව්වාම අපගේ මනසේ පැන නගින ප්‍රශ්නය තමයි කවුද මේ සාන්තුවරු. සාන්තුවරයෙක් ගැන ඇඳිලා තියෙන ප්‍රතිරූපය කුමක්ද ? උදාහරණ කිහිපයක් අරගෙන බලමු. අපේ රට පාලනය කරන ගරු ජනාධිපතිතුමා කිව්වාම එකපාරටම අපේ මතකයට එන්නේ හැඩි දැඩි සිරුරක් ඇති උඩු රැවුල වවා ගත් කෙනෙක්. ශෙහාන් මිහිරංග, සුරේන්ද්‍ර පෙරේරා වැනි ගායකයන් ගැනත් එහෙමයි. නම කිව් පමණින් ඒ අයගේ චරිත ලක්ෂණ දේහ ලක්ෂණ අපට මැවිලා පෙනවා. මේ හේතුව නිසාම අපි දන්නවා ඒ අය කොහොමද ගායනා කරන්නේ කියලා. ඒ වගේම ශුද්ධවන්තයින් ගැනත් විවිධ අදහස් ආකල්ප අප තුළ තිබෙනවා.

හුගදෙනෙක් හිතන්නේ ශුද්ධවන්තයෙක් කිව්වාම කිසිම පාපයක් නැති මව්කුසින් බිහිවු කෙනෙක් කියලා. සාමාන්‍යය ජීවිතයක් ගත නොකරපු අසාමාන්‍යය කෙනෙක් කියලා. එහෙම නොවේ අපි වගේම ඉපිද සාමාන්‍ය ජීවිතයක් ගත කරලා යහපත් දේ තෝරාගෙන දෙවිඳුන් වෙනුවෙන් ජීවිත පූජා කළ අය. විවිධ වයස් මට්ටම්වල ශුද්ධවන්තයින් ඉන්නවා.

වනවාසි අන්තෝනි, පාදුවාවේ අන්තෝනි වගේ වැඩිහිටි ශුද්ධවන්තයින් ඇලෝසියස් ගොන්සාගා, මරිය ගොරට්ටි වගේ තරුණ ශුද්ධවන්තයින් තෝමස් ඇක්වයිනස් වගේ බුද්ධිමත් ශුද්ධවන්තයින් නිර්මල හදවතක් තිබුන ජේසුගේ කුඩා මල තෙරේසා මුනිවරිය වැරදි කරලා එයින් මිදිලා ශුද්ධවන්ත වුණු ඔගස්ටින් වගේ ශුද්දවන්තයින් මේ හැමදෙනාගේ ජීවිත ආදර්ශයෙන් මගින් යම් දවසක ශුද්ධවන්තයෙක් වෙන්න පුළුවන්. ආදර දුවේ පුතේ ඒ නිසා හොඳ ළමයි වෙන්න උත්සාහ ගන්න.

නොවැම්බර් දෙවෙනි දා ඔබ හැමෝම මිනිපිට්ටිනියට ගිහිල්ලා ඔබේ ආච්චිලා සියලා, ඥාතීන් වෙනුවෙන් යාච්ඤා කරන්න ඇති. එදා ඔබට මොනවාද හිතුනේ. මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම පුණ්‍ය ක්‍රියාවක්. විශේෂයෙන් එදා ශුද්ධගිනි ස්ථානයේ දුක් විඳින ආත්මයන් වෙනුවෙන් යාච්ඤා කරන දවස. අපි හැමෝම යම් දවසක මැරෙනවා ඒ නිසා දැන් ඉඳන්ම එයට සූදානම් වෙන්න ඕන. වයසට යනකම් ඉන්න හොඳ නෑ මරණය අපට පරාජය ගෙන දෙන දෙයක් නොවෙයි. ස්වර්ගයට යන්න මාවතක්, එයට හැමෝම මුහුණ දිය යුතුයි. මරණය හරියට ක්‍රිකට් ක්‍රීඩාවේ තුන්වෙනි පිතිකරුවා වගෙයි. තුන් වෙනියා නිතරම සූදානම්ව සිටිය යුතුයි. ඔහුට බෑ තව වෙලා තියනවා. මම දැන් පිට්ටනියට ගිහිල්ලා කරන්න දෙයක් නෑ. එක පන්දුවයි තියෙන්නේ යනාදිය.

අද සමාජයේ හුගක් දරුවන් විසින් මරණය ලගා කර ගන්නවා. ඉස්සරහින් අත දීලා පස්සෙන් අනිනවා වගේ වැඩක්. සිගරට්, අරක්කු, කුඩු පිස්සු පෙති මේවා නිසා තමන්

**ඉතිරිය 14 පිටුවේ...**

# 2011 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරික්ෂණ පාඩම් මාලාව

සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය ප්‍රශ්න පත්‍රයේ අනිවාර්යෙන් පිළිතුරු සැපයිය යුතු කෙටි ප්‍රශ්න 10 ක් අන්තර්ගතය. මෙයට පෙරහුරුවක් වශයෙන් කෙටි ප්‍රශ්න 75 ක් සහ පිළිතුරු පසුගිය සතිවල පළ කෙරිනි. තවත් කෙටි ප්‍රශ්න 75 ක් මෙහි පළ වේ. මෙම කෙටි ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා විභාගය සඳහා හුරුවක් ලබා ගන්න.

76. දේවරාජ්‍යයේ පදනම් තුන නම් කරන්න.

77. දෙවියන් වහන්සේ මෝසෙස්ට කථා කළ මුල්ම අවස්ථාවේ සඳහන් කළ පුද්ගලයින් තිදෙනා නම් කරන්න.

78. ඊශ්‍රායෙල් ජනතාව පාරාවෝ රජු යටතේ කළ කර්මාන්ත දෙකක් නම් කරන්න.

79. අශ්වයින් දමනයට කටකලියාව ඇමුවත්. සැඩ සුළඟට ගසා යන විශාල නැවක් සුක්කානමකින් දමනය කළත්, දමනය කළ නොහැකි යමක් පිළිබඳව ජාකොබ් තුමා පවසයි. එය කුමක්ද ?

80. ඊශ්‍රායෙල් ජනතාවට නායකත්වය දුන් මෝසෙස්ගේ සහයට සමිඳාණන් වහන්සේ ලබා දුන් තැනැත්තා කවුද ?

81. කතෝලික සභා මාතාව 2008 / 2009 වසර කැප කරන ලද සාන්තුවරයා කවුද ?

82. කතෝලික සභා ධර්මෝපදේශය පෙන්වා දෙන පරිදි සුබ අස්නේ හදවත කුමක්ද ?

83. ප්‍රසාද නිධානය ලැයිස්තුවේ අභිවෘද්ධි ආලේපය දෙවැනි තැනට ඇතුළත් වීමට හේතුව කුමක්ද ?

84. ශුද්ධවූ පාවුළුතුමා සඳහන් කරන පරිදි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් අපට ලැබෙන ආධ්‍යාත්මික දීමනා දෙකක් නම් කරන්න.

85. ආශිර්වාදකාර බන්ධනය නමැති ප්‍රසාද නිධානයේදී පූජා ප්‍රසාදිතුමාගේ කාර්යය දෙකක් නම් කරන්න.

86. පව් කමාව අයදින යාච්ඤා දෙකක් නම් කරන්න.

87. මතෙව් තුමා සඳහන් කරන ස්වාමිවාක් ආරාධනාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

88. ස්වාභාවික නීතිය යනු කුමක්ද ?

89. ප්‍රේමයේ පනත කුමක්ද ?

90. ඉරුදින ස්වාමින් වහන්සේගේ දිනය යනුවෙන් නම් කිරීමට හේතු දෙකක් නම් කරන්න.

අලගොල්ලෑව සා. අන්තෝනි මහ විද්‍යාලයේ
ගුරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

91. ජනවන්දනාවේ කේන්ද්‍රය වන්නේ කුමක්ද ?

92. විශ්වාසකයින්ගේ ආත්මයේ නොමැකෙන ලාංඡනයක් පදිංචි වන නිසා දේව ප්‍රසාද නිධාන තුනක් එකවරකට වඩා ලබා ගත නොහැකිය. එම දේව ප්‍රසාද නිධාන තුන නම් කරන්න.

93. ශ්‍රී ලංකාවේ රදගුරු මණ්ඩලය විසින් අනුමත කර ඇති දේව මෑණියන් හා සම්බන්ධ ණය මංගල්‍ය දෙකක් නම් කරන්න.

94. පව් කමාව පිළිබඳව ජේසුස් වහන්සේ වදාළ උපමා කථා දෙකක් නම් කරන්න.

95. ශ්‍රී ලංකාවේ සේවය කළ ඔරතෝරියානු නිකායික පියවරුන් දෙදෙනෙක් නම් කරන්න.

96. ජුදා සිනගෝගයකට හා මුස්ලිම් පල්ලියකට ඇතුළු වූ පළමු පාප්තුමා නම් කරන්න.

97. දෙවියන් වහන්සේගේ නාමය කුමක්දැයි මෝසෙස් තුමා ඇසූ විට දෙවියන් වහන්සේ එළිදරව් කළ නාමය කුමක්ද ?

98. “ධර්මයාණන්” පිළිබඳව කතා කරන සුවිශේෂකවරයා කවුද ?

99. මාංශගතවීමේ අභිරහස යනු කුමක්ද ?

100. නව ආදම් යනු කව්ද ?

101. ඉශ්‍රායෙල් ආගමික නායකයින් ජේසුස් වහන්සේ සමඟ උරණ වීමට හේතු වූ කරුණු දෙකක් නම් කරන්න.

102. ක්‍රිස්තුන් වහන්සේ විසින් උත්ථාන කරනු ලැබූ දෙදෙනෙක් නම් කරන්න.

103. ජේසුස් ස්වාමින් වහන්සේගේ සේවක ස්වරූපය කැපී පෙනුණු ප්‍රබල අවස්ථා නම් කරන්න.

104. ජනවන්දනාවේ යාම යැඳුම කුමක්ද ?

105. කතෝලික සභා ධර්මෝපදේශය පෙන්වා දෙන පරිදි බරපතල පාපයක් කර තිබේ නම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට පෙර කුමක් කළ යුතුද ?

106. කතෝලික සභා ධර්මෝපදේශය පෙන්වා දෙන පරිදි ශුද්ධවූ අගුස්තීනු මුනිතුමා පාපොච්චාරණය වෙනුවට භාවිත කරන නම කුමක්ද ?

107. පුරාණ ගිවිසුමෙහි සඳහන් වන මුල්ම පූජකවරයා නම් කරන්න.

108. පූජා ප්‍රසාදිවරුන් අතර ප්‍රධාන කණ්ඩායම් දෙක නම් කරන්න.

109. තාපස ජීවිතය ක්‍රමවත් කරමින් ඊට මෙහෙවර කළ පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න.

110. භාවනාශීලි සහ ගැඹුරු යාච්ඤාවට යොමු වූ ස්වදේශීය පැවිදි නිකායක් නම් කරන්න.

111. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවට අනුව පැවිදි දිවිය තුළ මූලික තැන දිය යුතු පැතිකඩ තුන නම් කරන්න.

112. තාපස ජීවිතයකට විනය මාලාවක් සකස් කිරිමට පුරෝගාමී වූ දෙදෙනා නම් කරන්න.

113. පැරණි ගිවිසුමේ පූජකවරු ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතුකම් දෙකක් නම් කරන්න.

114. ක්‍රිස්තුන් වහන්සේගේ ත්‍රිත්ව කාර්ය නම් කරන්න.

115. ලෝකයේ සෑම කාලයකට වෙසෙන සියලු මනුෂ්‍යයන් උදෙසා ජේසුස් වහන්සේ විසින් උත්ථාන කරනු ලැබූ නැවතත් මරණයට පත් දෙදෙනෙක් නම් කරන්න.

116. වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව නමැති විශ්ව ප්‍රකාශනයට අනුව කිතුනු විවාහයක පරමාර්ථ දෙකක් නම් කරන්න.

117. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව රදගුරුතුමකුගේ කාර්යභාර්යයන් දෙකක් නම් කරන්න.

118. සියලුම පැවිදි පන්තිවලට පොදු ධර්මගුණ හතරක් නම් කරන්න.

119. මුල්කාලීනව තපස්වරු ගත කළේ කුමන ජීවිත තත්ත්වයක්ද ?

120. "සාන්ත සභාව" පූර්ණව විද්‍යාමාන වන්නේ කුමන ප්‍රසාද නිධානය තුළ ද ?

121. ජේසුස් වහන්සේ රෝගීන් සුව කළ ආකාර දෙකක් නම් කරන්න.

122. හෙබ්‍රෙව් හසුනට අනුව දෙවියන් වහන්සේ ආදි යුග වලදී විවිධකාරයෙන් කථා කළ සේක. දෙවියන් වහන්සේ අවසානයේදී කවුරුන් මගින් අපට කථා කළ සේක්ද ?

123. දිනපතා තිරින්දාදි සීනු නාදය ඇසෙන විට අප විසින් සිහිපත් කරන්නේ කුමක්ද ?

124. "මනුෂ්‍යයා මෙලොව ජීවිතයේ මෙන්ම මතු ජීවිතයෙහි ද සතුටින් ජීවත්වීම දෙවියන් වහන්සේට ප්‍රශංසාවකි" යන්න කවුරුන්ගේ අදහසක්ද ?

125. "අල්ෆා" සහ "ඔමේගා" යන්නෙහි අර්ථය කුමක්ද ?

126. ජේසුස් ස්වාමින් වහන්සේ නාසරෙත්හි ධර්මශාලාවේදී කියවන ලද්දේ කවුරුන්ගේ ග්‍රන්ථය ද

127. ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ නව අඥාව කුමක්ද ?

128. ජේසුස් ස්වාමින් වහන්සේ දේව රාජ්‍යයට ඇතුළු වන්නෝ කවුරුහුද යන්න අනාවරණය කර ඇත්තේ කුමක් මගින්ද ?

129. ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් යුක්තව කිනම් ප්‍රදේශයට පැමිණ ඉගැන්වූ සේක් ද ?

130. ලූක් සුබාරංචිය අනුව ජේසුස් වහන්සේ වැඩි වශයෙන් ඉගැන්වූයේ කොහේද ?

131. නාසරෙත් නුවර ධර්ම ශාලාවේ ජේසුස් ස්වාමීන් වහන්සේගේ දේශනාවට අනුව උන්වහන්සේගේ දූත කාර්යය දෙකක් නම් කරන්න.

132. කිසියම් පුද්ගලයෙක් භාග්‍යවන්ත ද කියා සොයා බලන ක්‍රම දෙකක් නම් කරන්න.

133. "පන්සලේ පියතුමා" යන නාමයෙන් හඳුන්වන දේශීය සංගීතය වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් කළ පියතුමා කවුද ?

134. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් විශ්වාසය තබමින් ජීවිත පූජා කළ මෙරට සිද්ධියක් නම් කරන්න.

135. අපේ සංස්කෘතිකයට ආවේනික සාරධර්ම දෙකක් නම් කරන්න.

136. තේවාචාර්ය තුමකුගේ කාර්යභාරය දෙකක් නම් කරන්න.

137. සමදර්ශක සුවිශේෂ නම් කරන්න.

138. සත්‍ය සභාවක් තුළ තිබිය යුතු ලක්ෂණ හතර නම් කරන්න.

139. පුරාණ ගිවිසුමේදී දෙවියන් වහන්සේ සමඟ ගිවිසුම් ඇති කරගත් පුද්ගල චරිත දෙකක් නම් කරන්න.

140. අපෝස්තුළුවරුන්ගේ පැවත එන එකම ශුද්ධවූ කතෝලික සභාව කුමක් මගින් දේව අනාවරණය අපට පහදා දෙන්නී ද ?

14 පිටුවට ....

# මීගමුව සා. පීතර විදුහලේ සිසුන් සිව් දෙනෙකුට සමස්ත ලංකා ජයග්‍රහණයන්...



"සමස්ත ලංකා බටහිර සංගීත සහ නැටුම් තරඟාවලි 2010" මීගමුව සා. පීතර මහ විදුහලේ සිසුන් සිව්දෙනෙකු විශිෂ්ට දස්කම් පාමින් විදුහල් මාතාවට ගෞරවයක් අත් කර දුනි. මෙම විදුහලේ ප්‍රසාද් සමරසිංහ හා සුදේශ් නිර්මාල් "රොකෝඩර් වාදන" පිළිවලින් කණ්ඩායම් තරග (විවෘත) හා ඒකල (ජ්‍යෙෂ්ඨ) අංශයෙහි තෙවන ස්ථානය ද අශෝක් සෙල්වරත්නම් ඔකේෂ්ට්‍රා සමූහ වාදක මණ්ඩල තෙවන ස්ථානය දිනාගත් අතර නිලුක්ෂන් ප්‍රනාන්දු "රෙකෝඩර් " වාදනය ඒකල (කනිෂ්ට) දෙවන ස්ථානය දිනා ගැනීමට සමත් වුණි. මෙහි ත්‍යාග ප්‍රධානය පසුගියදා කොළඹ ආනන්ද විද්‍යාලයේදී ගරු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්වුණි.

සමස්ත ලංකා ජයග්‍රගණයක් ලැබූ සිසුන් සිව් දෙනා පාසලේ බටහිර සංගීත ආචාර්යවරිය වන වාසනා පීරිස් මහත්මිය සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු මෙහි දිස්වේ. **(මිල්ටන් ජෝසප් - මීගමුව)**

## මොරටුව කටුකුරුන්ද දහම් ළමුන්ට ලේඛන වැඩමුළුවක්

ළමුන්ගේ ලේඛන, කුසලතා, නිර්මාණ හැකියාවන් වැඩි වර්ධනය කිරීමේ අරමුණින් හා ළමුන්ව තව තවත් ලේඛන කලාවට යොමු කිරීම හා ළමා ප්‍රදිපය පුවත්පත ළමුන් අතර වඩාත් ජනප්‍රිය කරලීම මුලික කොට ගෙන සංවිධාන කෙරෙන ලේඛන වැඩමුළුවක් 2011 නොවැම්බර් 13 වන ඉරුදින මොරටුව කටුකුරුන්ද සා. මරියා දේවස්ථානයේදී පෙ.ව. 8.30 - පෙ.ව. 10.00 දක්වා 6 ශ්‍රේණියේ සිට 10 වසර දක්වා ළමුන් වෙනුවෙන් පැවැත්වේ. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. කටුකුරුන්ද මිසම් සේවක ගරු ක්‍රිශාන්තස් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමාගේ අනුශාසකත්වයෙන්, දහම් ගුරු මණ්ඩලයේ හා ධර්මදූත ළමා සමාජයේ සංවිධානයෙන් දහම් පාසල් සංවර්ධන සමිතියේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරේ. **අසික ප්‍රියදර්ශන**






මොරටුව සා. සෙබස්තියන් විදුහලේ ළමුන් 226 දෙනෙකු පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහ
පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් කළුතර සිරිකුරුස විදුහලේ අධ්‍යක්ෂ ආචාර්ය ගරු කැමිලස් ප්‍රනාන්දු, මොරටුව
අවස්ථාවට පියතුමෝ රැසක් සහභාගී වූහ. ළමුන්, ගරු පියතුමන්ලා, ප්‍රාථමික අංශ විදුහල්පති ගරු දයා

## 2011 ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වූ හලාවත සාන්ත මරියා ප්‍රාථමික බාලිකා සිසුවියෝ



හලාවත සාන්ත මරියා ප්‍රාථමික බාලිකා විදුහලේ 2011 වසරේ 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සිසුවියෝ තිස්දෙනකු සමත් වූහ. ඔවුන්ට සිප් සතරෙන් පෝෂණය කළ ගුරුවරියන් හා විදුහල්පතිනි ගරු දිනේෂිකා පැවිදි සොයුරිය සමග සිසුවියන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු.

**ජෙරූෂා සිල්වා**
**5 ශ්‍රේණිය, සා. මරියා ප්‍රාථමික බාලිකා විදුහල - හලාවත**

මාසික සිතිවිල්ල

## ජයග්‍රාහී නිර්මාණය

**ඔක්තෝබර් මස පළවූ ඡායාරූපයට අප වෙත ලැබුණු නිර්මාණ අතරින් ජයග්‍රාහී නිර්මාණයයි මේ. අපේ සුබ පැතුම් !**



සෙනෙහස නැති දරුවන්ට සෙනෙහස ලබා දී
අසරණ වූ අයට සරණ හා සුවය ලබා දී
දෙවි පියාණන්ට ප්‍රසන්න ජීවිතයක් ගත කරමින්
ලොවට ආදර්ශමත් වූ ඔබ සදා අමරණීයයි මව්නි
ඔබේ සියලු ගත සිත දෙවිඳුන්ට ඔසවා,
ඔබ එදා කළ කැපවීම සදා අමරණීයයි මව්නි,
මව්නි, ඔබේ සුවය ඔබ නොතකා
ඔබ කළ සේවය සදා අමරණීයයි තෙරේසා මව් තුමියනි.

**සඳුෂා ප්‍රනාන්දු - 7 ශ්‍රේණිය, සා. මරියා දහම් පාසල, කටුකුරුන්ද.**



සේයා : ටී. සුනිල් ප්‍රනාන්දු

මෙහි පළ වන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

මාසික සිතිවිල්ල, “නොවැම්බර් මාසය”
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



න්සේ ලබා ගත්හ . විදුහල් දෙව් මැදුරේදී පැවැති දේව මෙහෙය කොළඹ දකුණු කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු ව සා. සෙබස්තියන් විදුහලේ විදුහල්පති අධ්‍යක්ෂ ගරු බොනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමන්ලාගේ සහභාගීත්වයෙන් පැවැත්වුණි. මේ දැර්ශණ පියතුමා, ළමුන් පුහුණු කළ පැවැදි සොයුරිය හා ආචාර්යවරියන් සමග සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. **කුමර**

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 32

ඒ කියන්නෙ එක්තරා තත්ත්වයක් මතු වුනොත් තවත් දෙයක් සිදුවිය හැකියි කියන අදහසයි. මේවා සිදුවිය නොහැකි දේවල් නෙමේ. සිදුවිය හැකි දේවල්.

ඔබ ගෙදර ආවොත් පොත දෙන්නම්

If you come - ඔබ ආවොත් (වියහැකි දෙයක්)

If it rains - වැස්සොත් (විය හැකි දෙයක්)

If I find your pen - ඔබේ පෑන හම්බවුනොත් (විය හැකි දෙයක්)

මෙන්න මෙවැනි අදහස් ප්‍රකාශ කරද්දී අපි **"If"** සමඟ යොදන්නෙ සාමාන්‍යයෙන් **Present Tense** ක්‍රියා පදයක්. ඉහත සඳහන් වාක්‍ය නැවත කියවා බලන්න. "If" සමඟ හැමවිටම යෙදී තියෙන්නේ වර්තමාන (Present Tense) ක්‍රියාවක්. ඒ වගේම බොහෝ අවස්ථාවලදී වාක්‍ය දෙවන කොටසට යෙදෙන්නේ will + Present Tense ක්‍රියා පදයකුයි.

දැන් අපි නැවත ඉහත වැකි ප්‍රවේශමෙන් අධ්‍යනය කරමු.

If you + **come** I + ***will give*** the book.

If it + **rains** we + ***will not play*** football.

If Sunil + **doesn't come** who+ ***will give*** the speech.

If I + **find** your pen I ***will give*** it to you

If mother + **goes** to the market she+ ***will buy*** some mangoes

දැන් ඔබට පැහැදිලිද?

සිදුවීමට බැරිකමක් නැති දේවල් පිළිබඳ කතා කරද්දී, එදිනෙදා තිබිය හැකි සාමාන්‍ය දෙයක් ගැන අවිනිශ්චිත බව හඟවන්න, අපි මේ රටාවට තමයි "If" යොදන්නෙ.

මේ ඉහත සඳහන් කළ රටාව අපි සාමාන්‍යයෙන් හඳුන්වන්නෙ Conditional (1) කියල.

## Conditional 2

ඊළඟට අපි දෙවන අවස්ථාවක් ගැනත් කතා කරන්න පුළුවන්. ඒකට කියන්නේ "Conditional 2" (කන්ඩිෂනල් ටූ) කියල. මොකක්ද මේකෙන් ප්‍රකාශ වෙන වෙනස? මේකෙදී අපි කතා කරන්නෙ කලින් වගේ සිදුවිය හැකි, සිදුවීමට බැරිකමක් නැති දෙයක් ගැන නෙමේ. අපි මේ Conditional 2 වලදී කතා කරන්නෙ.

මනඃකල්පිත තත්ත්වයක් ගැන හෝ "සිදුවූවා නම් කොහොම තියේවිද" කියන අරුත ඇතිව ප්‍රකාශ වන දේ ගැනයි. බොහෝ විට සිදුනොවන සාමාන්‍යයෙන් කිසිසේත් සිදුවිය නොහැකි, ඒත් සිදුවුවානම් කියන ප්‍රාර්ථනය හෝ උපකල්පනය ඇතුව ප්‍රකාශ කරන දේ පිළිබඳවයි,

මෙම **Conditional 2** වලදී අපි **If** යොදන හැටි බලමු.

- If I were you, I would not do that.
  මම ඔබ වුනා නම්, ඔය වැඩේ කරන්නෙ නෑ.
  (උපකල්පනය - මට ඔබ වෙන්න බෑ)
- If I went to Colombo, I would not be here.
  මම කොළඹ ගියානම්, දැන් මෙතන නෑ. (මම කොළඹ ගියේ නෑ)
- If she were present, she would sing a song.
  ඇය සිටියානම් ගීයක් ගයාවි (නමුත් ඇය මෙහි නෑ. ඉන්න විදිහක් නෑ)
- If father built this house, I would own it.
  තාත්තා මේ ගේ හැදුවා නම්, මං ඒක අයිති කරගන්නවා. (තාත්තා නෙමේ හදලා තියෙන්නේ - එහෙම වුනා නම් කියන ප්‍රාර්ථනය පමණක් එහි අඩංගුයි.)
- If I found your pen, I would give it.
  මට ඔබේ පෑන ලැබුනා නම් මම දෙනවා. (මට හම්බවුනේ නෑ - නමුත් බැරිවෙලාවත් හමුවානනම් කියන ප්‍රාර්තනය එහි අඩංගුයි)
- If you won a million rupees, what would you do?
  ඔබ රුපියල් මිලියනයක් දින්නොත්, ඔබ මොකද කරන්නේ? (කිසිසේත් බලාපොරොත්තු නොවන උපකල්පනයක්)
- If you studied hard, you would pass the exam.
  ඔබ මහන්සි වී පාඩම් කළා නම්, පාස් වෙනවා.
  (නමුත් ඔබ පාඩම් කරන්නෙ නෑ. පාඩම් කළා නම් කියන තත්ත්වය උපකල්පනය කරගෙනයි මෙතනැදි මෙම ප්‍රකාශය කරන්නෙ. ඇයි පාඩම් කරන්නෙ නැත්තෙ කියන අදහස)
- If I wanted to go, I would go. මට යන්න ඕන නම් මම යනවා.
  (මට යන්න ඕන කමක් නෑ කියන අදහස)

බලන්න, ඉහත වැකි සියල්ලෙන්ම කියැවෙන්නේ නොසිදුවූ දෙයක්, එසේ වුවානම් කියන අදහස පිළිබිඹුවන වැකි. උපකල්පනය පමණක් සීමා වූ ක්‍රියාවන් ගැන කියවෙන වැකි.

ඉතින් මේ (Conditional 2) වලටත් සාමාන්‍ය වාක්‍ය රටාවක් තියෙනවා. ඒ තමයි වාක්‍යයේ කොටස් දෙකේම ක්‍රියා පදය අතීත ස්වරූපයේ තිබීම.

ලබන සතියට...




# ආච්චි වෙතටයි

කොටහේනේ ඩඩ්ලි පෙරේරා



නෝනයි, මහත්තයයි, බේබියි කාරයට නගින හැටි පුංචි සේකර ජනේලයෙන් බලා සිටියේය. ඒ ගොල්ල මුහුද වෙරළට යනවලු. මටත් හරි ආසයි එහෙයන්ඩ, ඒත් කොහොමද මම යන්නේ.... ඔහුට ඉබේටම තොල් මැතිරුනි. කාරය ගේට්ටුවෙන් හැරවී නොපෙනී යන තුරු මැලවී ගිය මුහුණින් බලා සිටි සේකර ජනෙල් පළුව වාසා දමා කාමරයට දිවීය.

ලාච්චුවක යමක් සෙවීය එළියට ගත්තේ කොලයකුත් පැන්සලයකුත්ය. කාමරයට බැස යන හිරු ගේ මඳ එළිය වැටෙමින් තිබිනි. සේකර ජනෙල් පඩිය මත හිඳගෙන ලියන්නට පන් ගති.

ආදරණීය ආච්චියේ....

එදා මාව මෙහාට පීතර මාමා එක්කං ඇවිත් ඇරලුවාට පස්සේ ආවේ නෑ. ඇයි ආච්චි මාව බලන්න එන්නෙ නැත්තේ... ආච්චිට සනීප නැතුවද ?

ලිවීම මදක් නතර කළ සේකර පාලු නිසල අහස දෙසට නෙත් යැවීය. තමාගේ මතකයේ හැටියට ඔහු තම ගම ගැන සිහි කළේය. ජීවිතයේ කිසි දිනක තම පියාව නොදුටු සේකර ඉතා ස්වල්ප කලක් තම මවගේ උණුසුම් ආදරය ලැබුවා මතකය. මව හදිසියේමය ගියාට පසු තමාව බලා ගත්තේ ආච්චිය.

ආච්චි ගැන සිහිවෙත්ම, නොදැනුවත්ම ඔහුගේ දෙනෙතට නැගුණු කඳුළු, දෙකපොලු දිගේ බේරෙන්නට විය.

"මට ඉන්නෙ ආච්චි විතරයි.." මුමුනමින් ඔහු නැවත ලියන්නට පටන් ගති.

ඇයි ආච්චියේ මාව බලන්ඩ එන්නෙ නැත්තෙ මාත් එක්ක තරහද ?

ගෙදර මහත්තයා හරිම සැරයි නෝනත් ඒ වාගෙමයි.... බේබි හරියට මට ගහනවා එතකොට නෝනයි මහත්තයයි හිනා වෙනවා. මට හරියට කන්ඩ දෙන්නෙත් නෑ අනේ ආච්චියේ ඇවිත් මාව මෙහෙන් එක්ක යන්න....

අකුරු ආච්චියට තේරෙයිද ? ආච්චි කොහොම හරි කියවාවි ඔහු සිතීය...

ඒ සමගම තමා අකුරු ලියන්නට උගත් හැටිද, ඔහුගේ මතක යට ආවේය.

වලව්වේ හිටි කාලයේ වලව්වේ පුංචි නෝනා තමාට චක්කරය කියවීමටත් අකුරු ලියන්නටත් කරුණාවෙන් කියා දුන්නේය.

ලිවීම නතර කළ ඔහුගේ.... කල්පනාව නැවත අතීතයට යොමු වුණි.

ගමේ වලව්වේ කෑම උයන්නේ ආච්චි වලව්වේ සිටි කාලයේ ආච්චි තමාව කුස්සියේ මුල්ලක හිඳුවා ලොකු බත් පිඟානක් බඩ පැලෙනතුරු කවන සැටි ඔහුට මතකය. දවසක් ආච්චි තමාව ලඟ තියා හිස අතගාමින් ඇඩූ සැටිද, පසුව පීතර මාමා තමාව මේ ගෙදරට ගෙනා සැටිද සේකරට එකින් එකට මතක් විය.

ඔහු ලිපියේ ඉතිරි කොටසද ලියන්නට විය.

"ආච්චියේ මම කන්ඩ ඉල්ලා කරදර කරන්නේ නැහැ... මම කොහොම හරි ගිහින් කන්ඩ හොයා ගන්නංට. ඇවිත් මාව ගමට එක්කං යන්ට... ආච්චියට බුදු බව අත් වෙයි.

ඔහු මෙතෙක් වේලා ලියූ කුඩා ලිපිය නැවත කියවන්නට පටන් ගති. මේ පුංචි නෝනාත් මේ ලියුම බලල හුඟක් සංතෝස වේවි... මට පුංච නෝනව දකින්නත් හරි ආසයි. එයා හරියට අපේ අම්මා වගේමයි. පීතර මාමාත් මට හරි ආදරෙයි. පීතර මාමා මාව දවසක් නුවර පෙරහැර බලන්ඩ ගෙනිච්චා මාමා මේ වේලාවට වලව්ව මුර කරනවා ඇති. ආච්චි ඉඳගෙන කල්පනා කරනවා ඇති.....

සිතිවිල්ලෙන් මිදුනු ඔහු නැවත තම පොල් ගෙඩි අකුරින් ලියන්ට පටන් ගති.

"ආච්චියේ... මට වලව්වේ පුංචි නෝනයි, පීතර මාමාවයි බලන්ඩ හරි ආසයි. ඒක නිසා අනේ ආච්චියේ කොහොම හරි මේ මාසෙ එන්න මාව එක්කගෙන ගමට යන්න...

මේ ආදර පුතා...

සේකර

ඔහු ලිපිය දෙකට තුනට නවා වටපිට බැලීය. පාන් වලින් ඉතුරු සත තුනට ගත් ලියුම් කවරය ඔහු ලාච්චුවකින් එළියට ගෙන ලියුම ඒ තුළට දමා කට වැසිය

අනික් පස හැරවූ ඔහු ලිපියේ ආච්චි වෙතටයි ගම නුවර කියා ලිවීය.

සේකර ලියුම යවන සැටි මොහොතක් කල්පනා කළේය. බංගලාව ඉදිරිපිට සාප්පුවේ දෙමළ මුදලාලි ලියුම් පෙට්ටිය තියෙන තැන කීවා ඔහුට මතකය ..... ලියුම අතට ගත් ඔහු කුස්සිය දෙසට හිස යොමා බැලීය. හැම විටම තමාගේ වැරදි සොයන කුස්සි අම්මා ගොරෝ ගොරෝ නිදන හැටි දුටු සේකරගේ මුවේ ඉබේ සිනහාවක් නැගුනි. බංගලාවේ ගේට්ටුව ඇරගත් සේකර, ලිපිය මිට මොලවා ගෙන වේගයෙන් දිවීය. කඩේ මුදලාලි කිව් ලියුම් කනුව දුටු සේකරට කිසි දිනක නොලැබූ සතුටක් ඇති විය. ඔහු පෙරටත් වඩා වේගයෙන් ලියුම් කණුව වෙතට දිවීය.

**ළමා ප්‍රදීපය 2011 නත්තල් කලාපය සඳහා පිටකවර සිතුවම සිත්තම් කිරීමට අවස්ථාවක් ළමා ඔබට ලබා දීමට අපි තීරණය කළෙමු. වැඩි විස්තර ඉදිරියේදී.**

**සංස්කාරක පියතුමා**

## දේව අම්මා



**නිපුන් ප්‍රියංකර**
6 ශ්‍රේණිය,
සා. ජෝශප් දහම් පාසල,
වෙන්නප්පුව.

## කරුණාවන්ත පියාණෝ



**හිරුෂි දසුනිකා**
4 ශ්‍රේණිය,
ජයලත් මාතා දහම් පාසල,
මාවිල.

## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ



**බුද්ධිකා දමයන්ති**
10 ශ්‍රේණිය,
ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ
දහම් පාසල,
ශ්‍රැන්ඩ්පාස්

## කාදිනල් හිමිපාණෝ



**විහංගි මධුකලා නවමාලි**
4 ශ්‍රේණිය,
සීවලි නවෝදයා මහා
විද්‍යාලය,
බණ්ඩාරවෙල

## මල් වැලක්



**ශෂිකා සෙව්වන්දි**
9 ශ්‍රේණිය,
කාර්මෙල් බා.ම.ම. විදුහල,
හලාවත

### පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.
"පුංචි අපේ චිත්‍ර පිටුව" ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## මගේ ආදර තාත්තා



**නිර්මාල් පෙරේරා**
සා. සෙබස්තියන්
විදුහල,
මොරටුව

## හංසයෙක්



**චිරාත් නිලක්ෂ පෙරේරා**
3 ශ්‍රේණිය,
ශු. ෆ්‍රැන්සිස් අසීසි දහම් පාසල,
උඩුගම්පොල

## වනාන්තරයක්



**ආර්. තුෂාන් මලිත්**
5 ශ්‍රේණිය,
සාමයේ රැජින දහම් පාසල - මාලිගාවත්ත

## දියබොන අලි රංචුවක්



**හිමංසලා මල්ෂානි**
1 ශ්‍රේණිය, සිරිහඳ දහම් පාසල,
බොල්ලත.




## අගරදගුරු පදවිය



තුඩැල්ල අඩක්කල මාතා දෙව් මැදුරේ දී දරු දැරියෝ 58 දෙනෙකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලැබූහ. තුඩැල්ල මීසම් සේවක ගරු සිසිල් කුමාර පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය පැවති අතර දරු දැරියන් පුහුණු කළ කන්‍යාරාමයේ ගරු පැවිදි සොහොයුරිය ඇතුළු දහම් පාසල් ආචාර්ය මණ්ඩලය සමග දිව්‍ය සත්ප්‍රසාද ලැබූ ළමුන් සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු **නිශාන්ත රෝසා**

## කුරුණෑගල පදවිය



පැල්ලන්දෙනිය සාන්ත අන්තෝනි දේවස්ථානයේ දරු දැරියෝ 14 දෙනෙකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගත්හ.

එදින දිව්‍ය පූජාව මීසම් සේවක ගරු චන්දන හපුආරච්චි, ගරු එවරස්ට් පියතුමා (ක්ලැරේෂියානු නිකායික) හා ද ලාසාල් නිකායේ ගරු හෙන්රි දිසානායක සහෝදර තුමන් පැවැත්වීය. අනතුරුව මීසම් සේවක පියතුමා සහෝදරතුමන් හා දහම් ගුරුවරිය ද සමග සියලු දෙනාම දේවස්ථානය ඉදිරිපිට දී සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **අනුෂා රුවනි මැන්දිස්**




සාන්ත දොන් බොස්කෝ මුනිතුමන්ගේ ශුද්ධ ධාතු මෙරටට වැඩම කිරීම නිමිත්තෙන් සැකසූ විශේෂ වැඩසටහනක් මෙවර කිතුනු ළමා හමුවෙන් ඉදිරිපත්කෙරේ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයෙන් නොවැම්බර් මස 06 වන දින ප. ව. 5.30 මෙය ප්‍රචාරය වේ.

## දෙව් පිය සෙනෙහස

*අහසේ වලාකුළු පොළොව තෙමන විට දැනෙන සිසිලස සතුට ගෙනේ*
*අපට හිමිදිරියේ මල් පිපෙන විට දැනෙන සුවඳ අපට සතුට ගෙනේ.*
*සීතල සුළඟට ගස්වැල් නැළවෙන විට ලැබෙන සතුට කියන්න බැරි තරම්*
*රෑ කල සඳ පායන විට තරු මල් පිපෙනු දැක ලොකු සතුටක් දැනේ සිතට*
*මේ හැම දෙයකින් දෙව්පිය සෙනෙහස ලැබෙයි මගෙ දිවියට*

**ආර්. එම්. සඳලි පූර්ණිමා රණතුංග**
**5 ශ්‍රේණිය, සාන්ත මරියා දහම් පාසල - හාල්දඬුවන**

**07 පිටුවෙන්**

141. දිවැසිවැන්ට පැවරුණු ප්‍රධාන කාර්යයන් දෙකක් නම් කරන්න.

142. ජෙරමියා දිවැසිවරයා සඳහන් කරන අළුත් ගිවිසුම නම් කරන්න.

140. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත පිළිගන්වන ලද්දේ කවුරුන්ටද ?

143. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත පිළිගන්වන ලද්දේ කවුරුන්ටද ?

144. “පූජය යනු කුමක්ද ? එය ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයයි. එය ලබා ගන්නා අය කුමන තත්ත්වයකට පත් වෙනවාද ? ඔවුන් ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය බවට පත්වෙනවා. එක ශරීරයක් බවට. ශරීර රාශීයක් බවට නොවේ.” යන්න කවුරුන් විසින් කියන ලද්දක්ද ?

145. පොදු ජනවන්දනාව යනු කුමක්ද ?

146. ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුන්වන නම් දෙකක් ලියන්න.

147. ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද දෙකක් නම් කරන්න.

148. ජලයෙන් බව්තිස්ම නොලැබුවත්, දේව රාජ්‍යයට පිවිසෙන දෙපිරිසක් නම් කරන්න.

149. පස්වන පනතට විරුද්ධව කරන පාප දෙකක් නම් කරන්න.

150. අනෙකුත් මැවිලිවලට වඩා මනුෂ්‍යයාගේ ඇති විශේෂත්වය වන්නේ කුමක්ද ?

**පිළිතුරු ලබන සතියේ......**

**සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය 2 වන කොටස ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් ලබන සතියේදී**

## ළ.ක්‍රි.වී. නිර්මාතෘ පියතුමන් අනුස්මරණය...

ළ.ක්‍රි.වී. (ළමා ක්‍රියාකාරි වීරයෝ) නිර්මාතෘ ගරු ෆීලික්ස් මෙවල් (නි.ම.නි) පියතුමන් අනුස්මරණය කරමින් දිව්‍ය පූජාවක් හා විශේෂිත වැඩසටහනක් මීරිගම දෙවි මැදුරේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙය නොවැම්බර් මස 12 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා පැවැත්වේ.

**ගරු සුසිත් රන්දිල් නි.ම.නි පියතුමා**

**05 පිටුවෙන්**

විසින්ම මරණය ලගා කර ගන්නවා. දක්ෂයා තමයි මෙයින් ගැලවෙන්නේ දිනන්නේ, ආදර දුවේ පුතේ ඔබටත් අනාගත යේ මේ අභියෝග වලට මුහුණු දෙන්න සිදුවේ. ඔබට එයින් ජය ගන්න පුළුවන්.

ආදර දුවේ පුතේ අවාසනාවකට අපේ දරුවන් ජීවත් වුණත් ඉන්නේ මැරිලා වගේ. ඔහේ ජීවත් වෙනවා. ජීවිතයේ කිසිම අරමුණක් නැහැ. මේ ලගදි මම එක පාසලකට ගියා. ඒ පංතියේ ළමයි 13 දෙනෙක් අච්චුපොත් ගෙනල්ලා නෑ. තව පංතියක 25 දෙනෙක් ගෙදර වැඩ කරලා නැහැ. ඇහුවාම කියනවා අමතක වුණාලු. මේ ළමයි එතකොට මොකටද ඉස්කෝලේ එන්නේ කිසිම අරමුණක් නෑ. ඔබත් ආදර දුවේ පුතේ ඒ වගේද ? ඔබත් මේ දේවල් නිසා මැරිලා නම් ජේසුට කියන්න උත්ථාන කරන්න කියලා. අවිලාහි ශුද්ධවූ තෙරේසා මුනිවරිය ලස්සන යාච්ඤාවක් දිනපතා උච්චාරණය කළා. එය ඔබේ යාච්ඤාව කර ගන්න.

ජේසුනි මට සිහිවිකල් වෙලා මරණයට මුහුණ දෙන්න සලස්වන්න එපා. ජේසුනි මගේ ශරීරය කෑලි කෑලි වලට කැඩිලා විනාශ වෙන මරණයකට මාව යොමු කරන්න එපා. ජේසුනි මට ජීවිතය ගැන කලකිරිලා සිය දිවි හානි කර ගන්න මරණයකට මාව යොමු කරන්න එපා. සක්‍රමේන්තු ලබා ගෙන සාමකාමී මරණයකට මාව සුදානම් කරන්න. මගේ යැදුම මෙයයි. ජේසු කවදාවත් ඔබෙන් අහන්නේ නැහැ. ඔබ කොච්චර කල් ජීවත් වුණා ද කියලා අහන්නේ දැහැමි ලෙස ජීවත් වුණාද කියන එකයි. ඔබේ පිළිතුර කුමක්ද ?

## නොනිම් පහනක්ම වේවා !



*දහම් සිල්ප නැමති සයුර තරණය කරන්නට*
*හබලක් විය ළමා ප්‍රදීපය ළමෝ අපට*
*ගුරුහරු වුයේ යහමගින් දහම් දෙසා පතුරුවන්නට*
*ප්‍රදීපයක්ම වී එළිය කරනු මැන දිවි නොවැටී අඳුරට*

*රුපියල් දහයක් වැනි කුඩා මුදලකට බෙදන දහම් දැනුම*
*මිල කළ නොහැකිය එහි පිටු තුළ ඇති සැම වදනක්ම*
*නිර්මාණ චිත්‍ර, දස්කම්, එළි දැක්වීමට ඇති පහසුකම*
*කාසි නැතත් ඉංග්‍රීසි ඉගෙන ගැනීමට ප්‍රදීපයෙන් හැකිවීම*

*මුණිවර මුණිවරියන්ගේ ජිවිත කථා දැන ගැනීමට හැකි වීමද*
*ලොව පුරා තතු දැනීමට ඒ අයුරින්ම සැ මද*
*තුන් වසක් නොව ලොව පවතින තුරු ආයු වැළද*
*දැනුමෙන් පෝෂණය කරනු මතු ළමා පරපුරද*

**රෙබේකා සුපිපි වැන්ඩොට්**
**12 ශ්‍රේණිය, යහපත් එඬේරා බාලිකා විදුහල - නායකකන්ද**



## අපි වෙමු කිතුනු ළමුන් හඳුනාගෙ



**නම** - රුෂේන් නෙත්මික ප්‍රනාන්දු

**ශ්‍රේණිය** - 3 ශ්‍රේණිය

**දහම් පාසල** - සා. ජුඩ් දහම් පාසල වැල්ලබඩ (බෝපිටිය)

**කුසලතා** - පිහිණුම්, චිත්‍ර

## අපි වෙමු කිතුනු ළමුන්

නම :- ..........................................................................

ලිපිනය :- ..........................................................................

පාසල :- ..........................................................................

පංතිය :- ..........................................................................

උපන් දිනය :- ...................... නිවසේ දු. අ. ...................

දහම් පාසල :- ..........................................................................

මීසම :- ..........................................................................

සහභාගි වන සමිති සමාගම් :- ......................................

කුසලතා දක්වන ක්ෂේත්‍රය :- ......................................

(කවි කෙටි කතා. චිත්‍ර වාර්තා, වෙනත් )

අපි වෙමු කිතුනු ළමුන් වැඩ සටහනට මා ද ඇතුළත් කර ගන්න.

.................................... ..............................

අත්සන දිනය

අපි වෙමු කිතුනු ළමුන් ළමා පාඨක එකමුතුවේ ලියාපදිංචි වීමට ඔබත් කැමති නම් ඉහත ළමා ප්‍රදීපය ලාංඡනය සහිත පත්‍රිකා තුනක් එකතු කර අයැදුම් පත්‍රය පුරවා 2x2 ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපි වෙමු කිතුනු ළමුන්, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 ලිපිනයට තැපැල්

## ප්‍රහේළිකා අංක 27

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | 2 | ■ | 3 |
| | ■ | ■ | 4 | | |
| 5 | | 6 | | ■ | |
| ■ | ■ | | ■ | 7 | |
| 8 | | | | | ■ |
| ■ | ■ | | ■ | | ■ |

**හරහට**

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදූ සේක.
7. ............ ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වූ තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවූ එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ලුක් 10,19, 23 පරිච්ඡේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සලමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 26, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

**ප්‍රහේළිකා අංක 26 පිළිතුරු හා ප්‍රහේළිකා අංක 27 ලබන සතියේ පළ වේ.**

# ගැලවුම්කාර ජේසු

47 කොටස

ශු. ජුවාම්තුමාගේ සුවිශේෂයෙන්

සැකසුම : තිළිණ අලහකෝන්




කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා